1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/07/01/03 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2026.05.14 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ - 02/2026**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත.

**ඇස්තමේන්තු සකස් කිරීමේ සීමා, අනුමත කිරීමේ සීමා සහ ගිවිසුම්වලට එළැඹීමේ සීමා සංශෝධනය කිරීම**

දකුණු පළාත් සභාවට අයත් ආයතනවල ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීමේ බලතල විමධ්‍යගත කිරීම සඳහා නිකුත් කර ඇති 2019.12.27 දිනැති 11/2019, 2020.03.05 දිනැති 11/2019 (I) සහ 2020.11.18 දිනැති 11/2019 (II) අංක දරන ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛවල සඳහන් බලතල සීමා සංශෝධනය කිරීමට ඉදිරිපත්ව ඇති යෝජනා අනුව, මාගේ ප්‍රධානත්වයෙන් යුතුව අදාළ සියලු පාර්ශ්ව ද සමඟින් 2026.04.29 දින සිදු කරන ලද සාකච්ඡාවේ දී ගනු ලැබූ තීරණ ප්‍රකාර, ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ 11/2019, 11/2019 (I) සහ 11/2019 (II) අවලංගු කරමින් මෙම චක්‍රලේඛය නිකුත් කිරීම සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2026.05.11 දිනැතිව අනුමැතිය ලබා දී ඇති බව, දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/1/101/01 දරන 2026.05.13 දිනැති ලිපිය මඟින් මවෙත දන්වා ඇත.

02. ඒ අනුව, ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීම සඳහා වන බලතල පහත වගු අංක 1 හි සඳහන් අයුරින් ක්‍රියාත්මක කළ යුතු ය.

| අනු අංක | ඇස්තමේන්තු මූල්‍ය සීමාව (රු.) | ඇස්තමේන්තු සකස් කිරීම | නිර්දේශ කිරීම | අනුමත කිරීම |
|---|---|---|---|---|
| 1 | මිලියන 100 ට වැඩි | ශ්‍රී. ලං.තා.සේ. III/ II/ I/ විශේෂ පන්තියේ නිලධාරීන් | ශ්‍රී. ලං.තා.සේ. විශේෂ/ දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි/ වාරිමාර්ග/ පළාත් පාලන) / ප්‍රධාන ඉංජිනේරු (ගොඩනැගිලි/ වාරිමාර්ග/ පළාත් පාලන) / අධ්‍යක්ෂ (ඉංජිනේරු) / පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) |

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

| | | | | |
|---|---|---|---|---|
| 2 | මිලියන 100 දක්වා | ශ්‍රී. ලං.තා.සේ. III/ II/ I/ විශේෂ පන්තියේ නිලධාරීන් | ශ්‍රී. ලං.තා.සේ. විශේෂ/ දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි/ වාරිමාර්ග/ පළාත් පාලන) / ප්‍රධාන ඉංජිනේරු (ගොඩනැගිලි/ වාරිමාර්ග/ පළාත් පාලන) | අධ්‍යක්ෂ (ඉංජිනේරු) / පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ |
| 3 | මිලියන 50 දක්වා | ශ්‍රී. ලං.තා.සේ. III/ II/ I/ විශේෂ පන්තියේ නිලධාරීන් | ශ්‍රී. ලං.තා.සේ. විශේෂ/ දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි/ වාරිමාර්ග/ පළාත් පාලන) | ප්‍රධාන ඉංජිනේරු (ගොඩනැගිලි/ වාරිමාර්ග/ පළාත් පාලන) |
| 4 | මිලියන 25 දක්වා | ශ්‍රී. ලං.තා.සේ. III/ II/ I/ විශේෂ පන්තියේ නිලධාරීන් | ශ්‍රී. ලං.තා.සේ. (I / විශේෂ) / ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) | දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි/ වාරිමාර්ග/ පළාත් පාලන) / නාගරික ඉංජිනේරු |
| 5 | මිලියන 10 දක්වා | ශ්‍රී. ලං.තා.සේ. III/ II/ I/ විශේෂ පන්තියේ නිලධාරීන් | ශ්‍රී. ලං.තා.සේ. (I/ විශේෂ) | ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) / සිවිල් ඉංජිනේරු (සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව) |
| 6 | මිලියන 3.5 දක්වා | ශ්‍රී. ලං.තා.සේ. පුහුණු/ III/ II/ I/ විශේෂ පන්තියේ නිලධාරීන් | ශ්‍රී. ලං.තා.සේ. II/ I/ පන්තියේ නිලධාරීන්<br>• II/ I/ පන්තියේ තාක්ෂණ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතනවල පුහුණු ශ්‍රේණිය සහ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන්ට ඉටු කළ හැකි ය.<br>• එක් තාක්ෂණ නිලධරයෙකු පමණක් සිටින පළාත් පාලන ආයතනවල එම නිලධරයා විසින් සකසන ඇස්තමේන්තු පළාත් පාලන ආයතන ප්‍රධානියාට සෘජුව ම අනුමත කළ හැකි ය. | පළාත් පාලන ආයතන ප්‍රධානී/ ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම්<br>• තම ආයතන වෙත සේවය සැපයීම සඳහා ශ්‍රී. ලං.තා.සේ. (විශේෂ) නිලධරයෙක් අනුයුක්තව සිටින්නේ නම්, එම නිලධරයාගේ නිර්දේශය මත මෙම සීමාව ඉක්මවා මිලියන 5 දක්වා අනුමත කිරීම සිදු කළ හැකි ය. |

ශ්‍රී. ලං.තා.සේ. - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය

**(වගු අංක 1)**

2.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් විසින් නිර්දේශ කර අනුමත කරනු ලබන සීමාවෙහි පවතින වැඩ වුව ද, එම වැඩයේ ස්වභාවය හා සංකීර්ණභාවය අනුව ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකුගේ උපදෙස් අනුව සිදු කළ යුතු ය. ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකු නොමැති නම් ඒ සඳහා සුදුසුකම් සහිත ඉංජිනේරුමය ආයතනයක් වෙත දන්වා කාර්යය ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු ය. (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය/ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය)

03. **ඒකක මිල ගණන් යොදා ගැනීම හා මිල විශ්ලේෂණ අනුමැතිය**

3.1 දකුණු පළාත් මූල්‍ය රීති 425.1.2 ප්‍රකාර ඉදිකිරීම් සම්බන්ධයෙන් පළාත සඳහා සකස් කරනු ලබන පොදු මිල ගණන් ලේඛන, අදාළ වර්ෂය ආරම්භ වීමට දින 30 කට මත්තෙන් වැඩ ඇස්තමේන්තු පිළියෙල කරන, නිර්දේශ කරන හා අනුමත කරන බලධාරීන් වෙත නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් ලිඛිතව ලබා දිය යුතු වේ.

3.2 වෙළෙඳ පොළෙහි අමුද්‍රව්‍ය මිල ගණන් සලකා බලා පළාත් රේට් කමිටුව විසින් පොදු මිල ගණන් ලේඛන (BSR, ISR, HSR) සැකසිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී ඒවාට අදාළ සංශෝධන සිදු කළ යුතු ය.

3.3 දකුණු පළාත් සභා මූල්‍ය රීති 425.1.1 යටතේ ඉදිකිරීම් සම්බන්ධයෙන් පළාත් රේට් කමිටුව විසින් අනුමත කරනු ලබන මිල ගණන් අනුසාරයෙන් ඇස්තමේන්තු සකස් කළ යුතු ය.

04. ඇස්තමේන්තු සඳහා අවශ්‍ය විශේෂ මිල ගණන් සහ විචලන සඳහා වන මිල ගණන් අනුමත කිරීමේ බලතල ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය සහිත, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ඉංජිනේරුවරුන් (සිවිල්) වෙත පවතී. මිල ගණන් සකස් කිරීමේ දී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් නිකුත් කරනු ලබන තාක්ෂණික උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ.

05. **රැඳවුම් මුදල් නිදහස් කිරීම**

5.1 <u>ඉංජිනේරුවරුන් රහිත ආයතන සම්බන්ධව</u>

5.1.1 කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 3.5 දක්වා තාක්ෂණ සේවයේ සියලුම ශ්‍රේණිවල (III/ II/ I/ විශේෂ) නිලධාරීන්ගේ නිර්දේශ මත රැඳවුම් මුදල් නිදහස් කළ හැකි ය.

5.1.2 කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 5 දක්වා තාක්ෂණ සේවයේ (විශේෂ) නිලධාරීන් අනුයුක්ත කර තිබේ නම් ඔවුන්ගේ නිර්දේශ මත රැඳවුම් මුදල් නිදහස් කළ හැකි ය.

5.1.3 රුපියල් මිලියන 5 ඉක්මවා යන්නේ නම් අදාළ ආයතන පද්ධතියේ** සිටින ඉංජිනේරුවරයෙක් වෙත යොමු කර ඒ සඳහා නිර්දේශ ලබා ගත යුතු ය.

**** උදා: අදාළ ආයතනය පළාත් පාලන ආයතනයක් වන විට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙක්ගේ නිර්දේශය වැනි .....**

5.2 ඉංජිනේරුවරුන් සහිත ආයතන සම්බන්ධව

5.2.1 මේ සඳහා ඉහත වගු අංක 1 හි සඳහන් සීමා කොන්ත්‍රාත්තු මුදල සඳහා මාර්ගෝපදේශ ලෙස භාවිතා කළ හැකි අතර, ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබා දෙන ආයතනයේ අවශ්‍යතා හෝ ඉදිකිරීමේ ස්වභාවය අනුව ඉහළ නිලධරයෙකු පරීක්ෂා කර බලා නිර්දේශ කිරීම සුදුසු අවස්ථාවන්හි දී, ව්‍යාපෘතියේ ස්වභාවය අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියාට අදාළ සීමාව තීරණය කිරීමේ හැකියාව ඇත.

06. සියලු කොන්ත්‍රාත් පරිපාලන කටයුතු/ අධීක්ෂණ කටයුතු සඳහා ඉහත මූල්‍ය සීමා බාධාවක් නොවිය යුතු ය.

07. ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ - 03/2025 මඟින් ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් නියම කර ඇති ප්‍රසම්පාදන කමිටු සීමාවන් සහ ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ - 03/2025 ට අදාළව මතුවට සිදු කරනු ලැබිය හැකි සංශෝධනයන්ට අදාළ සීමාවන්, කොන්ත්‍රාත් සම්බන්ධ ගිවිසුම්ගත වීම සඳහා ද එපරිද්දෙන් ම අදාළ වේ.

08. පළාත් පාලන ආයතන සඳහා අදාළ වන මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත සහ අනෙකුත් අණපනත් හා ප්‍රඥප්ති මඟින් එම ආයතනවලට පැවරී ඇති බලතල ප්‍රකාර ගිවිසුම්වලට එළැඹීමේ බලතල එකී ආයතන සතු වන අතර, එම බලතල අනුව කටයුතු කළ හැකි ය.

09. මෙම චක්‍රලේඛය 2026.04.01 දින සිට බලාත්මක වන අතර, ඇස්තමේන්තු අනුමත කිරීම් හා ගිවිසුම්වලට එළැඹීමේ බලතල පිළිබඳව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ 11/2019, 11/2019 (I) සහ 11/2019 (II) එදින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරමි.

10. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය/ පළාත් පාලන ආයතනය යටතේ පවතින සියලු ආයතන දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.

**චන්දිම සී. මුහන්දිරම්ගේ**

ප්‍රධාන ලේකම්

දකුණු පළාත

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.පි.

2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා), දකුණු පළාත. - දැ.ගැ.පි. සහ අ.ක.ස.

3. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.

**දුරකථන : 091-49 44 007** **ෆැක්ස් : 091-22 32 691** **විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com**